# හැඳින්වීම.

''ජාතක කතා'' යනු පුද්ගල ජීවිතයකට ලැබ ගත හැකි ආර්ථික, සමාජීය දේශපාලනික, අධ්‍යාපනික හා සදාචාරාත්මක උපදේශ පිරි විශ්ව සාහිත්‍යයේ අග්‍රගණ්‍ය කතාන්දර වශයෙන් හැඳින්විය හැකි ය. එහෙයින් විවිධ විද්වතුන් ජාතක කතා පිළිබඳ විවිධ පර්යේෂණ සිදුකර ඇත. එනමුත් ජාතක කතාවල පිළිබිඹුවන බෞද්ධ අධ්‍යාපන සංකල්ප පිළිබඳ ව මෙතෙක් පැහැදිලි ලෙස පර්යේෂණයක් සිදුකර නොමැත. එහෙයින් මෙම අධ්‍යයනයෙන් පර්යේෂකයා බලාපොරොත්තු වන්නේ ජාතක කතාවන් තුළ ඇති බෞද්ධ අධ්‍යාපන සංකල්ප සොයා බලා ඉදිරිපත් කිරීම යි.

ජාතක කතා රචනා වී ඇත්තේ තවත් කෙනෙකු දැනුවත් කිරීම උදෙසා ම ය. එම දැනුවත් කිරීම ජීවිතයේ විවිධ අංශයන් උදෙසා යොමු වී ඇත. එහෙයින් ජාතක කතා තුළ ඉතා පුළුල් අධ්‍යාපනය සංකල්පයක් අන්තර්ගත ව ඇත. විශේෂයෙන් ම

ශිෂ්‍යයා හඳුනාගැනීම,
ශිෂ්‍යයා පෙළඹවීම,
ශිෂ්‍ය පෞරුෂය ගොඩනැංවීම,
ගුරු කාර්ය භාරය,
ශිෂ්‍ය කාර්ය භාරය,
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය,
ශ්‍රව්‍ය දෘශ්‍ය භාවිතය,
අධ්‍යාපන මධ්‍යස්ථාන,
විවිධ දඬුවම් ක්‍රම,
අධ්‍යාපන අරමුණු හා පරමාර්ථ සාධනය

ආදිය පිළිබඳ ව ජාතක කතාවලින් බොහෝ තොරතුරු සොයා ගත හැකි ය. එම තොරතුරු මැනවින් පරීක්ෂාකර බැලීමේ දී පැහැදිලි වන්නේ නිවන නැමැති පරමාර්ථයත් විවිධ ලෞකික අධ්‍යාපනික අරමුණුත් සාක්ෂාත් කර ගැනීම උදෙසා පුද්ගලයා මෙහෙයවා ඇති බව යි.

ජාතක කතාවල අධ්‍යාපන සංකල්ප අධ්‍යයනයේ දී පැහැදිලිවන ප්‍රධාන ම කාරණය වන්නේ එය අරමුණු සාක්ෂාත් කිරීමෙන් නොනැවතී පරිණත පෞරුෂත්වයක් කරා පුද්ගලයා යොමු කර ඇති බව යි. එහි ලා අධ්‍යාපන මූලධර්ම පැහැදිලි කිරීම පිණිස ස්වාභාවික පරිසරය, වන සිවුපාවුන්, පක්ෂීන්, අධිමානුෂික සත්ත්ව කොට්ඨාස, සාමාන්‍ය සමාජයේ විවිධ මානව චරිත හා විවිධ සන්සිද්ධි යොදාගෙන ඇත.

සෑම ජාතක කතාවකින් ම කිසියම් අධ්‍යාපන අරමුණක්, පරමාර්ථයක්, ක්‍රමවේදයක්, නිර්ණායකයක්, පෙළඹවීමක්, පෞරුෂ වර්ධනයක් අපේක්ෂා කර ඉදිරිපත් කර ඇත. ඒ බව නිදසුන් ලෙස අපණ්ණක, වණ්ණුපථ, විරෝචන, උම්මග්ග, විධුර, සත්තුභත්ත, සත්තිගුම්බ, සස, නලිනි, සම්මෝදමාන, වෙස්සන්තර, සුතසෝම, කච්ජප, ලෝමහංස, ඡද්දන්ත ආදී ජාතක කතා කිහිපයකින් වුව ද දැක්විය හැකි ය.

ජාතක කතාවලින් හෙළිවන බෞද්ධ අධ්‍යාපන සංකල්ප අධ්‍යයනය කිරීමේ දී පැහැදිලිවන තවත් කාරණයක් වන්නේ අධ්‍යාපනයේ පරමාර්ථය බුද්ධි වර්ධනය පමණක් නොවන බව ය. අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ වන්නේ බුද්ධිමය හා සදාචාරමය යන උභය අංශයේ ම සංවර්ධනයක් උදාකර ගැනීම යි. ''විද්‍යා දදාති විනයං'' යන සංස්කෘත සාහිත්‍යාගත කියමන යන්න ජාතක කතාවන් ගෙන් මැනවින් පිළිබිඹුකර ඇත.

පියාජේගේ බුද්ධිවර්ධන න්‍යායය,
මාස් ලෝ ගේ අවශ්‍යතා න්‍යායය,

ආදිය ජාතක කතාවල මැනවින් නිරූපණය කොට ඇත. එසේ ම ශිෂ්‍යයා ඉගෙනීම් ක්‍රියාවලියට පොළඹවා ගන්නා ආකාරය ඉතා උපක්‍රමශීලී ව සිදු කර ඇත. එසේ ම විවිධ පෞරුෂ මට්ටම් පිළිබඳ ව බොහෝ තොරතුරු ජාතක කතාවලින් සොයා ගත හැකි අතර අධ්‍යාපන පෞරුෂයේ ඉහළ ම ස්ථානය වෙත පුද්ගලයා යොමු කිරීමෙන් ම අධ්‍යාපනයේ පරමාර්ථය දක්වා ඇත. ශිෂ්‍යයා තුළ ආක්‍රමණශීලී, ප්‍රචණ්ඩ, අකීකරු හැසිරීම් මෙන් ම සුවච කීකරු, මෘදු, මොලොක්, ක්‍රියාශීලි, සංවේදී හැසිරීම් ද ජාතක කතා තුළ මැනවින් ඉස්මතු වී පෙනේ.

ජාතක කතාවල අධ්‍යාපන සංකල්ප අධ්‍යයනයේ දී දැකිය හැකි අනෙක් කාරණය වන්නේ විධිමත් අධ්‍යාපනයත්, අවිධිමත් අධ්‍යාපනයත්, නොවිධිමත් අධ්‍යාපනයත් පිළිබඳ ව පවා තොරතුරු ජාතක කතාවල ඇති බව යි. පොතපතින් ලබා ගන්නා වූ බුද්ධිවර්ධනයටත් වඩා දෑත දෙපයේ රැකියා අවස්ථා (වෘත්තීය අධ්‍යාපනය) කෙරෙහි ද පුද්ගලයා යොමුකර ඇත. එසේ ම බුද්ධිමය රැකියා අවස්ථා පිළිබඳ ව ද තොරතුරු ජාතක කතාවන්හි දැක්වේ.

අධ්‍යාපන මනෝවිද්‍යාවේ විග්‍රහවන විවිධ න්‍යායයන් ඉගැන්වීම් ජාතක කතාවල දී දක්නට ලැබීම ද විශේෂ ය. ගුරු ගෙදර අධ්‍යාපනය, තක්ෂිලා අධ්‍යාපන මධ්‍යස්ථාන, එකල භාවිත කළ අධ්‍යාපන ක්‍රම ශිල්ප ජාතක කතා වලින් හඳුනා ගත හැකි ය. ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රම වේදයන් ද ජාතක කතා තුළින් දැකිය හැකි වුවත් ඒ තුළ මානව කේන්ද්‍රීය බවක් ද දැකිය හැකි ය. බොහෝ තැනක ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමවේදයන් දැකිය හැකි ය. ගුරුවරයා නිතර ම අධ්‍යාපනයෙහි ලා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ

සුසාධ්‍යකරුවෙකුටත් වඩා මෙහෙයවන්නෙකු බවට පත්වී ඇති බව ඇතැම් ජාතක කතාවන් ගෙන් දැකිය හැකි ය.

පොදුවේ ගත් කල්හි බෝසතාණන් වහන්සේ නැමැති ශිෂ්‍යයාගේ ශිල්ප ශාලිකා වී ඇත්තේ ඒ ඒ ආත්මභාවයන් ය. එක් එක් ආත්මභාවයක් උන්වහන්සේගේ එක් පන්තියක් වී ඇත. විවිධ පන්තිවල දී විවිධ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද මඟින් බුද්ධත්වය නැමැති අධ්‍යාපනයේ ඉහළ ම පරමාර්ථය කරා උන්වහන්සේ අනුක්‍රමයෙන් ගමන් කර ඇත. එම ගමන් මඟ දැක්වෙන්නේ ''පාරමිතා'' නාමයෙනි. දසපාරමිතා යනු උන්වහන්සේගේ විෂය නිර්දේශය ලෙස ද දැක්විය හැකි ය.

එහෙයින් මේ අධ්‍යයනයේ දී පළමු ව ජාතක කතා පිළිබඳ ව සංක්ෂිප්ත හැඳින්වීමක් ඉදිරිපත කරනු ලැබේ. අනතුරු ව බෞද්ධ අධ්‍යාපන සංකල්ප ඉදිරිපත් කිරීමත් ඉනික්බිති ව බෞද්ධ අධ්‍යාපනය, බටහිර අධ්‍යාපන සංකල්ප සමඟ තුලනය කිරීමත් සිදු කෙරේ. මෙකී මූලික කරුණු සමඟ ජාතක කතා සන්සන්දනය කරමින් ජාතක කතාවල කොතෙක් දුරට අධ්‍යාපන මූලධර්ම, සංකල්ප අඩංගු වන්නේ දැයි පැහැදිලි කෙරේ. මේ පර්යේෂණයේ පරිච්ඡේද වර්ගීකරණය කර ඇත්තේ මෙසේ ය.

පළමු පරිච්ඡේදයේ දී ජාතක කතා හැඳින්වීම, ප්‍රභවය විකාසනය හා ව්‍යාප්තිය පිළිබඳ ව සංක්ෂිප්ත විග්‍රහයක් සිදු කෙරේ. එම පරිච්ඡේදයේ දී ම නූතන අධ්‍යාපන සංකල්ප පිළිබඳ ව ද සංක්ෂිප්ත හැඳින්වීමක් සිදු කර ඇත.

දෙවන පරිච්ඡේදයේ දී අධ්‍යාපනයෙහි ලා විශේෂ අවශ්‍යතා ඇති ළමුන් හඳුනා ගෙන ඔවුන්ට අවශ්‍ය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනය කිරීමක් සිදුකර ඇත. ඒවා ජාතක කතා සාහිත්‍යය තුළ කොතෙක් දුරට පිළිබිඹු වන්නේ ද යන්නත් මෙහි දී අධ්‍යයනයට කොට ඇත.

තුන්වන පරිච්ඡේදයේ දී අධ්‍යාපනයේ දී චිත්තවේග අභිප්‍රේරණ (පෙළඹීම්) දක්වන ආකාරය නූතන මත සහ බෞද්ධ මත සසඳමින් ඉදිරිපත් කොට ඇත. මෙහි ම දෙවන කොටසින් එකී කාරණ (සිද්ධාන්ත) ජාතක කතා තුළ කොතෙක් දුරට අවධාරණය කර ඇත්දැයි පැහැදිලි කොට ඇත.

හතරවන පරිච්ඡේදයේ දී අවධානය යොමුවන කාරණය වන්නේ විද්‍යාර්ථියාගේ පෞරුෂ වර්ධනය කෙරෙහි ය. එහෙයින් අධ්‍යාපන පෞරුෂ වර්ධනය පිළිබඳ බටහිර හා බෞද්ධ අදහස් දක්වමින් කරුණු ඉදිරිපත් කෙරෙන අතර මෙහි දෙවන කොටසින් එකී අධ්‍යාපන පෞරුෂයත් පෞරුෂ වර්ධනයත් ජාතක කතා තුළ පිළිබිඹු කර ඇති අයුරු දක්වා ඇත.

පස්වන පරිච්ඡේදයේ දී ආකල්ප සාරධර්ම සදාචාර ධර්ම ශිෂ්‍යයා තුළ ගොඩනංවන ආකාරයත් ඒවා ජාතක කතා තුළින් අවධාරිත ආකාරයත් පරීක්ෂා කර තොරතුරු ඉදිරිපත් කර ඇත.

හයවන පරිච්ඡේදයේ දී මෙකී සියලු කරුණු සැලකිල්ලට ගනිමින් අවසානයේ දී ජාතක කතා තුළ ඉතා පුළුල් අධ්‍යාපන සංකල්ප අරමුණු පරමාර්ථ ඇති බව පෙන්වමින් මෙකී අධ්‍යයනයේ නිගමනය ඉදිරිපත් කොට ඇති අතර සමස්ත නිගමනය හා යෝජනාවලියක් ඇසුරින් දක්වා ඇත.